**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 09 ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2)(ආ) | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි උපරිම සීමාව වන රු.100,000/- ඉක්මවා මාණ්ඩලික නොවන නිලධාරීන්ට අවස්ථා 07කදී එකතු වටිනාකම රු.1,010,400 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | ආයතනයේ කළමනාකරණ සහාකාර තනතුරේ නිලධාරීන්ට රු.100,000 ඉක්මවා මුදල් අත්තිකාරම් ලබා දීම ,වියදම් දැරීම හා අත්තිකාරම් බේරුම් කිරීම, අදාළ අංශයේ ප්‍රධාන නිලධාරීන්ගේ පූර්ණ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXVi පරිච්ඡේදයේ 3.1 වගන්තිය | 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. විගණකාධිපති වෙත යොමු කිරීමට කඩිනමින් කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 04 (i) වගන්තිය | පුස්තකාල පොත් එකතුව 100,000කට වඩා අඩුනම් පුස්තකාල ද්‍රව්‍ය සත්‍යාපනය වාර්ෂිකව සිදුකල යුතු වුවද ආයතනයේ පුස්තකාලයේ පැවති පොත් 25,709 සඳහා 2020 වර්ෂයෙන් පසුව සමීක්ෂණයන් සිදුකර නොතිබුණි. | සඳහන් කරන ලද කරුණු නිවැරදිය.මේ වන විට 2023 වර්ෂයේ පුස්තකාල පොත් සත්‍යාපනය කිරීම සිදුකර අවසන් බව. | චක්‍රලේඛ නියමයන් පරිදි කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | 2023 වර්ෂයේ දෙසැම්බර් පවත්වන ලද පාඨමාලා 14 ක විභාග ප්‍රතිඵල 2024 අප්‍රේල් 01 දක්වා නිකුත් කර නොතිබුණු අතර 2022 අධ්‍යයන වර්ෂයේ පවත්වන ලද විභාගයන්හි ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 05 සිට මාස 12 දින 02 දක්වා කාලයක් ගත කර තිබුණි. | ආයතනයේ කාර්ය මණ්ඩල හිඟතාව මත ශිෂ්‍ය ලියාපදිංචියේ සිට ප්‍රතිඵල නිකුත් කිරීම දක්වා කටයුතු කිරීමට කළමනාකරණ සහකාරවරුන් දෙදෙනෙක් පමණක් සිටින බව. | ප්‍රමාදයකින් තොරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට විධිවිධාන යෙදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.143,243,767 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.221,756,371 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.78,512,604 ඌනතාවයක් නිරීක්ෂණය විය. මෙම ඌනතාවයට ත්‍යාග හා ප්‍රදාන (මුදල්) ලැබීම් අඩුවීම, ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම අඩුවීම හා ක්ෂය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උපාධි අපේක්ෂකයින් විසින් පර්යේෂණ නිබන්ධන සකස් කර ආයතනයට භාරදීමෙන් පසුව ආයතනය විසින් අවස්ථා 22 කදී පළමු හා දෙවන පරීක්ෂකවරුන් වෙත යොමු කිරීමට දින 37 සිට දින 198 අතර දක්වා කාලයක් ගතකර තිබුණ අතර පර්යේෂණ නිබන්ධන පළමු පරීක්ෂක සහ දෙවන පරීක්ෂක විසින් පරීක්ෂා කිරීමට දින 90 කට වඩා ගතකළ අවස්ථා 40 ක් විය. ඉන් අවස්ථා 21 දී දින 180 කට වඩා වැඩි කාලයක්ද අවස්ථා 6 කදී දින 360 කට වඩා වැඩි කාලයක්ද ගත කර තිබුණි. එමෙන්ම මෙම පර්යේෂණ නිබන්ධන ඉදිරිපත් කළ සිසුන් 35 දෙනා වාචික පරීක්ෂණයට මුහුණ දුන් දින සිට දින 59 සිට දින 570 දක්වා කාලයකින් පසුව උපාධි ප්‍රදානෝත්සවයන් සඳහා සහභාගී කර තිබුණි. ඒ අනුව 2023 අප්‍රේල් සිට හා 2024 පෙබරවාරි දක්වා කාලය තුළ ප්‍රතිඵල සඳහා සනාථන සභාවේ අනුමැතිය ලැබී තිබුණු පර්යේෂණ නිබන්ධන 35 භාරදුන් දින සිට උපාධි ප්‍රදානෝත්සව පැවැත්වූ දිනය දක්වා දින 275 සිට දින 2037 දක්වා කාලයක් ගතවී තිබුණි. | වාචික පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව එහිදී ලබාදෙන නිර්දේශ අනුව නැවත නිබන්ධනය සකස් කර භාරදීම සඳහාද මාස කිහිපයක කාලයක් ලබා දෙනු ලැබේ. ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවය වර්ෂයකට එක් වරක් පමණක් පවත්වනු ලබයි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020, 2021 වර්ෂවල උපාධි ප්‍රදානෝත්සව නොපැවැත්වීම නිසා උපාධි ප්‍රදානය ප්‍රමාද වී ඇත. | උපාධි අපේක්ෂකයින්ට උපාධි ප්‍රදානය කිරීමේදී ප්‍රමාදයන් අවම වන පරිදි කටයුතු කල යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු මිලදී ගැනීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.7,242,940ක් වැයකර තිබුණි. | 2023 වර්ෂයේ අත්‍යාවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ආයතනික අරමුදලින් රු.7,242,940 වැය කර තිබුණි. 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණේ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු සඳහා රජයෙන් ලබාදුන් ප්‍රතිපාදන පාදක කොටගෙන බව. | ඉදිරි මිලදී ගැනීමේ අවශ්‍යතාවයන් කල් තියා හඳුනාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කල යුතුය. |